# වාර්ෂික වාර්තාව

# ஆண்டறிக்கை

# ANNUAL REPORT 2015

## ඉඩම් මැනුම් සභාව
## நில அளவைச் சபை
## Land Survey Council

**ඉඩම් මැනුම් සභාව, සර්වේයර් ජනරාල් කාර්යාලය,අංක150, කොළඹ 05**
**நில அளவைச் சபை, நில அளவையாளர் அதிபதி அலுவலகம்,இல.150 பெர்னாட்கொழும்பு 05**
**Land Survey Council, Surveyor General's Office,No 150, Colombo 05**

# පටුන


1. සභාපතිතුමාගේ පණිවුඩය 01

2. දැක්ම සහ මෙහෙවර 02

3. ඉඩම් මැනුම් සභාවේ කාර්යයන් 03

4. ඉඩම් මැනුම් සභාව සතු බලතල 04

5. ඉඩම් මැනුම් සභාවේ කාර්යය සාධන වාර්තාව 04

6. ඉඩම් මැනුම් සභාවේ කාර්යය මණ්ඩලය 06

7. ක්‍රියාකාරකම් 06

8. අධ්‍යයන හා පුහුණු වැඩ කටයුතු 09

9. මූල්‍ය කළමනාකරණය 10

10. 2015 වර්ෂය සභා අවසාන ගිණුම් ප්‍රකාශනය 11

    I. මූල්‍ය තත්ව ප්‍රකාශනය
    II. මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශනය
    III. ශුද්ධ වත්කම් බැරකම් ප්‍රකාශනය
    IV. මුදල් ප්‍රවාහ ප්‍රකාශය
    V. 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ සටහන
    VI. 2015 දෙසැම්බර් 31 දිනට පොදු ගිණුම් ප්‍රතිපත්ති

11. විගණකාධිපති වාර්තාව 14

# 01. සභාපතිතුමාගේ පණිවුඩය

ඉඩම් මැනුම් සභාව
අංක150,බර්නාඩ් සොයිසා මාවත
නාරාහේන්පිට
කොළඹ 05
01-03-2017

ගෝලීය තරඟකාරී වෙළඳපොල තුළ වෘත්තියෙන් උසස් මැනුම් සේවාවක් සැපයීම වස් වෘත්තීයවේදීන් ශක්තිමත් කිරීමට 2015 වසර තුළ ඉඩම් මැනුම් සභාවට හැකියාවක් ලැබීම පිළිබඳ බෙහෙවින් සතුටු වෙමි.

2002 අංක 17 දරන මැනුම් පනත තුළින් ඉඩම් මැනුම් සභාවට පැවරී ඇති කාර්යයන් හා බලතල ක්‍රියාත්මක කිරීමේ දී ප්‍රධාන වශයෙන් මිනින්දෝරුවරුන් ලියාපදිංචි කිරීම, ලියාපදිංචි මිනින්දෝරුවරුන් සඳහා වාර්ෂික මැනුම් බලපත්‍ර නිකුත් කිරීම, වෘත්තීයමය මිනින්දෝරුවරුන් සඳහා අඛණ්ඩ වෘත්තීය සංවර්ධන පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙන්ම ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගේ වෘත්තීයමය විනය පාලනය මැනුම් සභාවේ වගකීම් වේ. එපමණක් නොව ලියාපදිංචි මිනින්දෝරුවරුන්ට එරෙහිව මහජනයා ඉදිරිපත් කරන පැමිණිලි විභාග කිරීමත්, ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගේ තොරතුරු මහජනයා වෙත ලබා දීමත්, වෙනත් වෘත්තීයමය ආයතන සමග සමායෝජනය කිරීමත් ඉඩම් මැනුම් සභාවේ වගකීම් වලට අයත් ය.

මැනුම් පනතේ විධි විධානවලට අනුව ඉඩම් මැනුම් කටයුතු නියාමනය කිරීම පනත ක්‍රියාත්මක වී දශකයකටත් වැඩි කාලයක් ගත වූ පසුව හෝ 2015 වසරේදී ඒ සඳහා රෙගුලාසි සකස් කර අත්හදා බැලීමේ කාලයකට දිවයින පුරා මැනුම් කටයුතු නියාමනය සඳහා කටයුතු යොදන ලදී.

කෙටියෙන් සඳහන් කරන්නේ නම් සෑම මිනින්දෝරු වෘත්තිකයෙකුම තම වෘත්තීය කටයුතු ක්‍රමවත්ව සහ නියමිත ප්‍රමිතීන්ට අනුව පවත්වා ගැනීමට උනන්දු කරවීම මෙම රෙගුලාසිවල අපේක්ෂාව විය. මිනින්දෝරු වෘත්තිය සම්බන්ධ සියලු පාර්ශවයන්ගේ සහභාගීත්වය සහ කැපවීම මගින් එළිදුටු මෙම රෙගුලාසි අනුව කටයුතු කිරීම සෑම මිනින්දෝරු වෘත්තිකයෙකුට මෙන් ම පොදුවේ රටටම ප්‍රතිලාභ අත් වන්නක් බව මා තරයේ විශ්වාස කරමි. මෙම අත්හදා බැලීම් තුළින් ඉදිරිපත්වන කරුණු අනුව අදාළ රෙගුලාසි සංශෝධනය/වැඩි දියුණු කර ගැසට් මගින් ප්‍රකාශ කිරීමට කටයුතු කරනු ඇත.

ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගේ වෘත්තීය සංවර්ධනය මෙන්ම වෘත්තීමය විනය පවත්වා ගැනිම උදෙසා 2015 වසරේදී ද ලියාපදිංචි මිනින්දෝරුවරුන් හට අඛණ්ඩ වෘත්තිමය සංවර්ධන පුහුණු පාඨමාලා කිහිපයක් ම අනුමත කොට පැවැත්වීමට ඉඩම් මැනුම් සභාව විශේෂයෙන් කටයුතු කර ඇත. එහි දී පාඨමාලාවලට සහභාගී වීම සඳහා ලියාපදිංචි මිනින්දෝරුවරුන් විසින් දක්වන ලද උනන්දුව කැපී පෙනුනි.

සමාලෝචිත කාල සීමාව තුළ ඉඩම් මැනුම් සභාව හොඳින් පවත්වා ගෙන යාම සඳහා වැඩ බලන ලේකම්, ගණකාධිකාරී (අර්ධ කාලීන) ඇතුළු සමස්ත කාර්යය මණ්ඩල මෙන්ම ඉඩම් මැනුම් සභාවේ සාමාජිකයන්ගෙන් ලැබුණු සහයෝගය සහ කැපවීම පිළිබඳ මාගේ ස්තූතිය පුද කරමි.

පී.එම්.පී. උදයකාන්ත
සභාපති

# 02. දැක්ම සහ මෙහෙවර

## දැක්ම

ඉඩම් මැනුම් සඳහා ක්‍රමවත් රාමුවක අඛණ්ඩතාව පවත්වා ගනිමින් ජාතික සංවර්ධනය උදෙසා අපගේ භෞතික හා ස්වභාවික සම්පත්වල ප්‍රශස්ත හා තිරසාර උපයෝගිතාව තහවුරු කර, ඒ තුළින් තරඟකාරි ගෝලීය වෙළඳපොළ තුළ ගුණාත්මක මෙන්ම වෘත්තිය නිපුණත්වයෙන් යුත් මැනුම් සේවාවන් වෙත නාභිගත වී වෘත්තියමය පරිසරය ශක්තිමත් කිරීම අපගේ දැක්ම වේ.

## මෙහෙවර

මැනුම් වෘත්තිය හා එහි ව්‍යවහාරයන් ක්‍රමවත්ව පවත්වා ගන්නා බවටත්, වෘත්තියෙන් බලාපොරොත්තු වන්නාවූ තාක්ෂණික නියමයන් සහ සදාචාරමය ප්‍රමිතීන් වලට එකඟ වන ලෙස පුහුණුවක් හා අධ්‍යාපනයක් වෘත්තීයට ප්‍රවේශ වන්නන් වෙත ලැබෙන බවටත්, එම නිසා වෘත්තියේ යෙදෙන්නන් විසින් වෘත්තිය පැවැත්මේ ඉහළම ප්‍රමිතීන් පවත්වාගනු ලබන බව තහවුරු කිරීම ඉඩම් මැනුම් සභාවේ මෙහෙවර වේ.

# 03. ඉඩම් මැනුම් සභාවේ කාර්යයන්.

2002 අංක 17 දරන මැනුම් පනතේ සඳහන් විධි විධාන අනුව කොළඹ 05, කිරුළ පාර, අංක 150 ස්ථානයේ පිහිටි සර්වේයර් ජනරාල් කාර්යාල ගොඩනැගිල්ලේ බිම් මහල තුළ 2003 වර්ෂයේදි ඉඩම් මැනුම් සභාව ස්ථාපිත කරන ලදි.

ඉහත පනතේ 37 වගන්තියට අනුව ඉඩම් මැනුම් සභාවේ කාර්යයන් පහත පරිදි වේ.

(අ) ඉඩම් මැනීමට අදාළ ප්‍රමිති හා කාර්යය පටිපාටිය පවත්වා ගෙන යාම හා ඉඩම් මැනීමේ කටයුතුවල යෙදී සිටින තැනැත්තන් අතර වෘත්තීමය විනය පවත්වාගෙන යාම.

(ආ) ලියාපදිංචි මිනින්දෝරුවරු ලෙස ලියාපදිංචි කිරීම සඳහා මිනින්දෝරුවරුන්ගෙන් ඉල්ලුම්පත්‍ර භාරගැනීම සහ ඒ මිනින්දෝරුවරුන්ට ඉඩම් මැනීමේ කටයුතු කරගෙන යාම සඳහා නියමිත සුදුසුකම් සහ පලපුරුද්ද සහ හැකියාව සහ නිපුණතාවය ඇති බවට සභාව සෑහීමකට පත්වන අවස්ථාවන්හි ඔවුන් ලියාපදිංචි කිරීම.

(ඇ) වෘත්තියේ යෙදීමේ වාර්ෂික බලපත්‍ර නිකුත් කිරීම සඳහා ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගෙන් ඉල්ලුම්පත්‍ර භාර ගැනීම සහ ඉඩම් මැනීමේ වෘත්තියෙහි යෙදීමට එම මිනින්දෝරුවරුන්ට දැනුම හා දක්ෂතාවය ඇති බවට සභාව සෑහිමට පත්වන අවස්ථාවන්හි ඔවුන්ට එම බලපත්‍ර නිකුත් කිරීම.

(ඈ) ඉඩම් මැනීමේ යෙදී සිටින තැනැත්තන් අතර වෘත්තීමය අධ්‍යාපනය පිළිබඳ උසස් ප්‍රමිතීන් පවත්වාගෙන යාම ප්‍රවර්ධනය කිරීම.

(ඉ) මිනින්දෝරු වෘත්තියේ යෙදි සිටින සහ වාර්ෂික වෘත්තීය බලපත්‍ර ලබා ගැනීමට නියම කරන ලද තැනැත්තන්ගේ දැනුම හා දක්ෂතා වැඩිදියුණු කිරීමේ කාර්යය සඳහා වෘත්තීමය සංවර්ධන වැඩසටහන් ප්‍රවර්ධන කිරීම.

(ඊ) ඉඩම් මැනීම පිළිබඳ ශාස්ත්‍රිය හා වෘත්තීමය සුදුසුකම් පිළිගැනීම, ප්‍රායෝගික පලපුරුද්ද පිළිබඳ අවශ්‍යතා නියම කිරීම සහ ලියාපදිංචි මිනින්දෝරුවන් ලෙස ලියාපදිංචි විමට සහ වාර්ෂික වෘත්තිමය බලපත්‍ර නිකුත් කිරීම සඳහා වු අපේක්ෂකයන් වෙනුවෙන් සුදුසුකම් ලැබීමේ විභාග හා වෘත්තීමය සම්මුඛ පරික්ෂණ පැවැත්වීම.

(උ) ඉඩම් මැනීමේ යෙදි සිටින තැනැත්තන්ගේ අධ්‍යාපනය, පුහුණුව හා පිළිගැනීම යන කරුණුවලදි සම තත්වයක් සහ අන්‍යෝන්‍යතාවයක් ස්ථාපිත කිරීම සඳහා විදේශීය රටවල බලධරයන් සමඟ අන්‍යෝන්‍ය වැඩ පිළිවෙළවල් සඳහා එකඟතාවය ඇති කර ගැනීම හා ක්‍රියාත්මක කිරීම.

(ඌ) නියම කරන ලද අධ්‍යාපන ප්‍රමිතීන් පවත්වාගෙන යාම සඳහා ශ්‍රී ලංකාවේ ඉඩම් මැනුම් කටයුතු හා ඉඩම් තොරතුරු අධ්‍යාපන හා පුහුණු කටයුතු පිළිබඳව නියැලී සිටින ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම.

(එ) ශ්‍රී ලංකාවේ වෙනත් අදාළ වෘත්තිමය ආයතන හා සම්බන්ධ වෙමින් උසස් වෘත්තීය ප්‍රමිතින් පවත්වාගෙන යාම.

# 04. ඉඩම් මැනුම් සභාව සතු බලතල

( අ ) යම් චංචල හෝ නිශ්චල දේපළ අත්කර ගැනීම, දැරීම, බද්දට ගැනීම හෝ බද්දට දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම.

( ආ ) මුදලින් හෝ අන්‍යාකාරයේ වූ ත්‍යාග, ප්‍රදාන හෝ පරිත්‍යාග භාරගැනීමට සහ ස්වකීය කර්තව්‍යය ඉටු කිරීම සඳහා ඒවා යොදා ගැනීම.

( ඇ ) සභාවේ කටයුතු කරගෙන යෑම සඳහා අවශ්‍ය නිලධරයන් හා සේවකයන් පත් කිරීම.

( ඈ ) එසේ පත්කරන ලද නිලධරයන්ට සහ සේවකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික තීරණය කිරීම.

( ඉ ) ස්වකීය කර්තව්‍යයන් ඵලදායි ලෙස ඉටුකිරීම සඳහා කමිටු පත් කිරීම.

( ඊ ) ස්වකීය නිලධරයන් හා සේවකයන් සඳහා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමයක් පිහිටුවීම සහ සුභ සාධන හා ක්‍රීඩා පහසුකම් සැපයීම.

( උ ) සභාවේ කටයුතු පරිපාලනය සම්බන්ධයෙන් රීති සෑදීම සහ

( ඌ ) සාමාන්‍යයෙන් සභාවේ කර්තව්‍යය නිසි පරිදි ඉටු කිරීම පහසු කරලීම සඳහා අවශ්‍යවන අනෙකුත් සියලු දේ කිරීම.

# 05. 2015 වර්ෂය සඳහා ඉඩම් මැනුම් සභාවේ කාර්යය සාධනය

**1. ඉඩම් මැනුම් සභාවේ සංයුතිය**

2002 අංක 7 දරණ මැනුම් පනතේ 27 වැනි වගන්තිය අනුව ඉඩම් මැනුම් සභාව සාමාජිකයින් 7 දෙනෙකුගෙන් සමන්විත වේ.

(අ) නිලබලයෙන් පත්වන සාමාජිකයින්

i. සභාපති - සර්වේයර් ජනරාල් වරයා
ii. උප සභාපති - සර්වේයර් ජනරාල් විසින් නම් කරනු ලබන නියෝජ්‍ය සර්වේයර් ජනරාල්ට අඩු නොවන ධූරයක් දරණ ලියාපදිංචි මිනින්දෝරුවරයෙකු
iii. සාමාජික - 1969 අංක 21 මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතන පනත මගින් පිහිටුවා ඇති මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනයේ අධ්‍යක්ෂකවරයා

(ආ) පත්වන සාමාජිකයින්

i. සාමාජික - 1982 අංක 22 දරණ ශ්‍රී ලංකා මිනින්දෝරු ආයතනය (සංස්ථාගත කිරීමේ ) පනත මගින් සංස්ථාගත කරන ලද ශ්‍රී ලංකා මිනින්දෝරු ආයතනය විසින් නම් කරනු ලබන ඉඩම් මැනීම පිළිබඳ පුළුල් අත්දැකීම් හා ප්‍රත්‍යක්ෂ සාමාර්ථයන් දරණ මිනින්දෝරුවරුනතිදෙනෙක්

ii. සාමාජික - 1978 අංක 16 දරණ විශ්ව විද්‍යාල පනතින් පිහිටවූ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් විශ්ව විද්‍යාලයකින් නම්

කරනු ලබන අධ්‍යාපන, පරිපාලන, කළමනාකරණ හෝ ඉංජිනේරු විද්‍යාව යන ක්ෂේත්‍රයන් හි එක් විද්වතෙකු

iii. මෙම පත්කිරීම් අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබේ.

**2. 2015 දෙසැම්බර් 31 දිනට අදාළව ඉඩම් මැනුම් සභාවේ සාමාජිකයන් පහත දැක්වේ.**

I. පී.එම්.පී උදයකාන්ත මහතා, සභාපති
II. එස්.එම්.පි.පී. සංගක්කාර මහතා,උප සභාපති
III. එස්.ඩී.පී.ජේ. දාම්පේගම මහතා, සාමාජික
IV. ආචාර්ය කේ.ආර්.එම්.යු. බණ්ඩාර මහතා, සාමාජික
V. සී.ද.එස්. ගුණතිලක මහතා, සාමාජික
VI. එම්. කළුතන්ත්‍රි මහතා, සාමාජික
VII. ඩබ්ලිව්.ඒ.ඒ. විජේරත්න මහතා, සාමාජික

**3. සමාලෝචිත කාල සීමාව තුළ සභාවේ සමාජිකයන්ගේ සේවා කාල**

| | | |
|---|---|---|
| I. | පී.එම්.පී උදයකාන්ත මහතා ( සභාපති ) | - 2014.05.29 සිට |
| II. | එස්.එම්.පි.පී. සංසක්කාර මහතා ( උප සභාපති ) | - 2014.05.29 සිට |
| III. | එස්.ඩී.පී.ජේ. දාම්පේගම මහතා ( සාමාජික ) | - 2013.07.25 සිට |
| IV. | ආචාර්ය කේ.ආර්.එම්.යු බණ්ඩාර මහතා (සාමාජික) | - 2015.01.01 සිට |
| V. | සී.ද.එස්. ගුණතිලක මහතා (සාමාජික) | - 2015.01.01 සිට |
| VI. | එම්. කළුතන්ත්‍රි මහතා (සාමාජික) | - 2015.01.01 සිට |
| VII. | ඩබ්ලිව්.ඒ.ඒ. විජේරත්න මහතා ( සාමාජික) | - 2015.01.01 සිට |

**4. සභාවේ රැස්වීම් සඳහා සාමාජිකයන්ගේ සහභාගි වීම**

| | | <u>රැස්වීම් ගණන</u> |
|---|---|---|
| I. | පී.එම්.පී උදයකාන්ත මහතා ( සභාපති ) | - 19 |
| II. | එස්.එම්.පි.පී. සංගක්කාර මහතා ( උප සභාපති ) | - 19 |
| III. | එස්.ඩී.පී.ජේ. දාම්පේගම මහතා ( සාමාජික ) | - 16 |
| IV. | ආචාර්ය කේ.ආර්.එම්.යු බණ්ඩාර මහතා (සාමාජික) | - 18 |
| V. | සී.ද.එස්. ගුණතිලක මහතා (සාමාජික) | - 17 |
| VI. | එම්. කළුතන්ත්‍රි මහතා (සාමාජික) | - 18 |
| VII. | ඩබ්ලිව්.ඒ.ඒ. විජේරත්න මහතා ( සාමාජික) | - 17 |

## 06. ඉඩම් මැනුම් සභාවේ කාර්යය මණ්ඩලය

මැනුම් පනතේ 55 වැනි වගන්තිය මගින් සභාවේ කාර්යයන් කාර්යක්‍ෂමව ඉටු කිරීම සඳහා අවශ්‍යයයි සභාව සලකනු ලබන නිලධාරීන් හා සේවකයන් පත් කර ගැනීමට මැනුම් සභාවට බලය පැවරී ඇත. ඒ අනුව මැනුම් සභාවේ සමාලෝචිත කාල සීමාව තුළ කාර්ය මණ්ඩලය පහත සඳහන් පරිදි වේ.

1. ජී.ඩී.එස්.කේ. ගුණරත්න මහතා - 2009.01.01 සිට 2009.12.31 දක්වා
   වැඩ බලන ලේකම්

2. රංජිත් මහකුඹුර මහතා - 2008.03.01 සිට 2009.12.31 දක්වා
   ගණකාධිකාරි ( අර්ධ කාලීන පදනම මත)

3. ඩබ්ලිව්.ඒ.එස්.ප්‍රියදර්ශනි මෙනවිය - 2004.05.24 සිට 2009.12.31 දක්වා
   පරිගණක වැඩසටහන් සහකාර / ලිපිකරු

4. ආර්.එම්.එන්.රත්නායක මහත්මිය - 2013.03.18 සිට 2009.12.31 දක්වා
   පරිගණක වැඩසටහන් සහකාර / ලිපිකරු

5. ටී.ජී.ප්‍රනාන්දු මහතා - 2004.07.15 සිට 2009.12.31 දක්වා
   කාර්යාල කාර්ය සහායක


## 07. ඉඩම් මැනුම් සභාවේ ක්‍රියාකාරකම්

**1. ලියාපදිංචි කිරීම්**

2015.12.31 දිනට ලියාපදිංචි මුළු මිනින්දෝරු සංඛ්‍යාව 2074 ක් වූ අතර ඉන් 45 දෙනෙකු සමාලෝචිත වර්ෂය තුළ ලියාපදිංචි කල අය විය.

**2. වෘත්තියේ යෙදීම සඳහා වාර්ෂික බලපත්‍ර**

සමාලෝචිත වර්ෂය තුළ වෘත්තියේ යෙදීමට වාර්ෂික බලපත්‍ර 1048 ක් ලබාගෙන ඇත. ඒ අනුව 2015 වර්ෂයේ දී 2014 වර්ෂයට වඩා වාර්ෂික බලපත්‍ර ලබා ගැනිමේ සුළු අඩුවීමක් දක්නට ඇත.




2015 ජනවාරි 31 දා දක්වා සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික බලපත්‍ර ලබාගත් ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගේ මුලකුරු සමඟ නම, ලියාපදිංචි අංකය හා ජාතික හැඳුනුම්පත් අංකය යන විස්තර 2015 මාර්තු 27 දින අංක 1908 දරණ ගැසට් පත්‍රයේ I කොටසේ ප්‍රසිද්ධ කර පළ කර ඇත.

වාර්ෂික බලපත්‍ර ලබා ගත් ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගේ ලියාපදිංචි අංකය, මුලකුරු සමඟ නම, සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය, පදිංචි දිස්ත්‍රික්කය, ලිපිනය, දුරකථන අංක, වෘත්තියේ යෙදීමේ වාර්ෂික බලපත්‍ර අංකය හා බලපත්‍රය වලංගු කාල සීමාව ආදි විස්තර www.survey.gov.lk වෙබ් අඩවියට ඇතුළත් කර ඇත. තව ද, මෙම විස්තර ත්‍රෛමාසිකව යාවත්කාලීන කර පවත්වා ගෙන යනු ඇත.

## 3. මහජනතාව වෙත තොරතුරු ලබා දීම.

ඉඩම් මැනුම් සභාව විසින් ලබා දෙන සේවාවන් පිළිබඳ මහජනතාව දැනුවත් වී ඇති නිසා වසර සිය ගණනක් පැරණි පිඹුරු සම්බන්ධව වුවද, ඒවාට සම්බන්ධ වාර්ෂික බලපත්‍ර ලාභී මිනින්දෝරුවරුන්ගේ ජීව විස්තර තොරතුරු ලබා ගැනිම සඳහා නිබඳව ම ඉඩම් මැනුම් සභාව වෙත පැමිණෙන පිරිස් බොහෝ ය. එම තොරතුරු නිවැරදිව හා ඉක්මනින් ලබා දිම සඳහා වාර්ෂික බලපත්‍රලාභී සියළුම ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගේ පෞද්ගලික ලිපිනය, ලියාපදිංචි අංකය, වාර්ෂික බලපත්‍ර අංක ආදී තොරතුරු ඇතුළත් පරිගණකගත දත්ත පද්ධතියක් මැනුම් සභාව විසින් සකස් කර පවත්වා ගෙන යාමට කටයුතු කර ඇත. හැකිතාක් දුරට මෙම දත්ත පද්ධතියට ඔවුන්ගේ දුරකථන අංකද ඇතුළත් කර ඇති නිසා අවශ්‍ය පිඹුරුවල පිටපත් ලබා ගැනිමට දුරකථන මගින් ඔවුන් සම්බන්ධ කර ගැනිමේ පහසුකම මහජනතාවට ලැබී ඇත. එතකුදු වුව ද මේ දක්වා අප විසින් ලබා දෙන මෙම සේවාව හරහා මහජනතාවට අවශ්‍ය බලයලත් මිනින්දෝරුවරුන් විසින් පිළියෙළ කළ පැරණි පිඹුරුවල පිටපත් ලබා ගැනිමේ දී ලත් පිටුවහල ක්‍රමානුකූල නොවීම පිළිබඳව මැනුම් සභාව තෘප්තිමත් නොවේ. කෙසේ වුවද සමාලෝචිත කාල සීමාව තුළ මහජනතාවගේ ඉල්ලීම් අනුව අවස්ථා 268 ක දී තොරතුරු ලබා දී ඇත.

## 4. ඉඩම් මැනුම් සභාව වෙත ලද මහජන පැමිණිලි




අවසන් කරන ලද මුළු පැමිණිලි සංඛ්‍යාව

බලයලත් මිනින්දෝරුවරුන්ගේ වැඩ පිළිබඳ වෘත්තීමය විෂමාචාරවලට සම්බන්ධව 2014 වසරේ ලැබී විභාග කර අවසන් නොවූ පැමිණිලි 24 ක් සහ 2015 වසරේදි ලද පැමිණිලි 80 ක් විය. සමාලෝචිත කාල සීමාව තුළ ඉඩම් මැනුම් සභාව විසින් පැමිණිලි 70 ක මූලික විමර්ශන සහ විධිමත් පරීක්ෂණ කටයුතු සිදු කර

ඇත. ඒ අනුව 2015 වර්ෂයේ දී පැමිණිලි 64 ක වැඩ අවසන් කිරිමට හැකි වූ අතර, වර්ෂය අවසානයේ දී පරීක්ෂණ අවසන් නොවූ පැමිණිලි සංඛ්‍යාව 40 ක් විය.

සමහර පැමිණිලිවල ස්වභාවය අනුව එනම් අධිකරණ ක්‍රියාමාර්ගවලට යටත්, චෝදනා ඔප්පු කිරීමට තරම් වූ සාක්ෂි නොමැති, අධිකරණ නියෝග අනුව උසාවි කොමසාරිස්වරුන් ලෙස කරන ලද මැනුම්, ඉඩම් මැනුම් සභාවේ බලතල යටතේ ක්‍රියාකල නොහැකි, වැනි ගණයේ පැමිණිලි සම්බන්ධව පැමිණිලි කරුවන්ට සහනයක් ලැබෙන පරිදි අදාල ක්‍රියාමාර්ග ගැනීමට ඉඩම් මැනුම් සභාව අපොහොසත් විය.

2015 වසරේදි ඉඩම් මැනුම් සභාව විසින් පවත්වන ලද පරීක්ෂණ අනුව 2002 අංක 17 දරණ මැනුම් පනතේ විධි විධාන යටතේ වග උත්තරකාර බලයලත් මිනින්දෝරුවරුන්ට පහත සඳහන් පරිදි බලපත්‍ර අත්හිටුවීම් හෝ ලියාපදිංචිය අවලංගු කිරිම වැනි දඬුවම් පමුණුවා ඇත.

| පැමිණිලි අංක | ලියාපදිංචි අංක | මිනින්දෝරුවරයාගේ නම | පරීක්ෂණයේ තීරණය |
|---|---|---|---|
| LSC/5/767 | 19700887 | ජී.ආර්. ඩබ්ලිව්.එම්. වීරකෝන් | 2015-09-01 සිට 2016-08-31 දක්වා කාලයට ලියාපදිංචිය අත්හිටුවීම |
| LSC/5/768 | 19861266 | එස්. අන්දරවීර | 2015-09-01 සිට 2018-08-31 දක්වා කාලයට ලියාපදිංචිය අත්හිටුවීම |
| LSC/5/686 | 19770913 | ඩී.එම්. බුද්ධදාස | 2015-11-01 සිට 2016-04-30 දක්වා කාලයට වාර්ෂික බලපත්‍ර ලබාදීම අත්හිටුවීම |
| LSC/5/486 | 19890767 | ඩබ්ලිව්.ජී.ඩී.යූ. කරුණාරත්න | 2015-11-01 සිට 2016-04-30 දක්වා කාලයට වාර්ෂික බලපත්‍ර ලබාදීම අත්හිටුවීම |
| LSC/5/735 | 19950319 | ඩී.ආර්. කුමාරගේ | 2015-11-01 සිට 2016-10-31 දක්වා කාලයට වාර්ෂික බලපත්‍ර ලබාදීම අත්හිටුවීම |
| LSC/5/758 | 19780901 | එස්. ඒකනායක | 2015-11-01 සිට 2016-04-30 දක්වා කාලයට වාර්ෂික බලපත්‍ර ලබාදීම අත්හිටුවීම |
| LSC/5/706 | 20011071 | එම්.සී.එම්. රෆීක් | 2015-11-01 සිට 2016-10-31 දක්වා කාලයට වාර්ෂික බලපත්‍ර ලබාදීම අත්හිටුවීම |
| LSC/5/731 | 19860776 | ආර්. උයන්ගොඩ | 2015-12-01 සිට 2016-11-30 දක්වා කාලයට ලියාපදිංචිය අත්හිටුවීම |
| LSC/5/757 | 19710909 | බී.එල්.ඩී. ප්‍රනාන්දු | 2015-12-01 සිට 2016-05-31 දක්වා කාලයට වාර්ෂික බලපත්‍ර ලබාදීම අත්හිටුවීම |
| LSC/16/775 | 19850885 | කේ.ඩබ්ලිව්. පතිරණ | 2016-01-01 සිට 2016-06-30 දක්වා කාලයට වාර්ෂික බලපත්‍ර ලබාදීම අත්හිටුවීම |

# 08. අධ්‍යාපන හා පුහුණු වැඩ කටයුතු

## 1. අඛණ්ඩ වෘත්තීය සංවර්ධන ( CDP) පාඨමාලා

බිම් මැනීම හා සම්බන්ධව ගත් කළ අඛණ්ඩව වෘත්තීය සංවර්ධනය අත්‍යවශ්‍ය අංගයකි. එබැවින් සියළුම ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරුන් මැනුම් වෘත්තිය හා සම්බන්ධව නූතන තාක්ෂණය හා ක්‍රමවේද පිළිබඳව වූ පුහුණු පාඨමාලා / වැඩමුළු වලට සහභාගි වීම සඳහා උනන්දු කරවීම ඉඩම් මැනුම් සභාව විසින් සිදු කරනු ලබයි.

### I. ප්‍රථම වරට වෘත්තියේ යෙදීමේ බලපත්‍ර ලබාගන්නා මිනින්දෝරුවරුන් සඳහා වැඩමුළු

ඉඩම් මැනුම් සභාව විසින් වෘත්තියේ යෙදීම සඳහා ලියාපදිංචි මිනින්දෝරුවරුන් වෙත ලබා දෙන වාර්ෂික මැනුම් බලපත්‍රය යොදා ගනිමින් ඔවුන් වෘත්තීය මිනින්දෝරුවරුන් ලෙස තම ජීවන වෘත්තියට පිවිසෙන අවස්ථාවේදී ඔවුන් සඳහා දිශානුගත කිරීමේ පාඨමාලා පැවැත්වීම ද ඉඩම් මැනුම් සභාව විසින් අරඹා කර ඇත. එම පාඨමාලාවල දී සම්පත් දායකත්වය සඳහා විශාරද දැනුමක් හා පළපුරුද්දක් සහිත කීර්තිමත් ලියාපදිංචි මිනින්දෝරුවරුන් යොදා ගනිමින් නවක මිනින්දෝරුවන් හට අවශ්‍ය ඥානය සහ අවබෝධය ලබා දෙනු ඇත.

### II. වෙනත් ආයතන විසින් පවත්වනු ලැබූ අඛණ්ඩ වෘත්තිය සංවර්ධන පාඨමාලා


ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මිනින්දෝරු ආයතනය සහ ගම්පහ, බදුල්ල, මහනුවර දිස්ත්‍රික් බලයලත් මිනින්දෝරු සංගම් මගින් ලියාපදිංචි මිනින්දෝරුවරුන් සහ ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරුන් සඳහා අඛණ්ඩ වෘත්තිය සංවර්ධන පාඨමාලා පැවැත්වීම වෙනුවෙන් දක්වා ඇති උනන්දුව පිළිබඳ ඉඩම් මැනුම් සභාව අතිශයින් සතුටට පත්වන අතර එම පාඨමාලා ඉඩම් මැනුම් සභාව විසින් පිළිගැනීමට ලක්කර ඇත.

2015 වසරේදි පවත්වා ඇති අඛණ්ඩ වෘත්තිය සංවර්ධන පාඨමාලා පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| | ආයතනය | වෘත්තීය සංවර්ධන පාඨමාලාව | පැවැත්වූ දිනය |
|---|---|---|---|
| 1. | ඉඩම් මැනුම් සභාව | දිශානුගත කිරීමේ පාඨමාලාව | 2015-03-30 |
| 2. | ශ්‍රී ලංකා මිනින්දෝරු ආයතනය | නාගරික සංවර්ධන පනත(නීති) සහ ඉඩම් බෙදුම් පනත(නීති) | 2015-06-15 |
| 3. | ඉඩම් මැනුම් සභාව | ගෝලීය පිහිටුම් පද්ධතියේ නව නැඹුරුතාවන් (New Trends in GPS) | 2015-06-19 |
| 4. | මහනුවර දිස්ත්‍රික් බලයලත් මිනින්දෝරු සංගමය | බිම් සවිය පසුකාලීන මැනුම් | 2015-08-09 |
| 5. | ඉඩම් මැනුම් සභාව | ක්ෂේත්‍ර මැනුම් හා පිඹුරු සැකසීම ස්වයංක්‍රියනය සහ පරිගණක ආශ්‍රිත ඇඳීම් ක්‍රම | 2015-09-07 |

# 09. මූල්‍ය කළමනාකරණය

**1. ආදායම් සහ වියදම්**




**2014/2015 මුළු ආදායම**

කලින් වර්ෂයේ දී ඉඩම් මැනුම් සභාව ඉපැයූ ආදායම රු. 4,893,381.62 හා මෙම වර්ෂයේ ආදායම රු.4,355,714,.75 බව ඉහත සටහන මගින් දැක්වේ. අදාළ කාලය සඳහා සභාවේ වියදම රු.5,088,383.67 කි. ඒ අනුව 2015 වසර තුළදී මුළු ආදායම ඉක්මවා වියදම් කිරීමට සිදු වූ මුදල රු.732,668.92 කි.

2010,2011,2012,2013 හා 2014 වර්ෂවල මෙන්ම 2015 වසරේ දී ද මහා භාණ්ඩාගාරයෙන් කිසිදු ප්‍රතිපාදනයක් ලබා දි නැත.


**2. ප්‍රතිපාදන**

ඉඩම් මැනුම් සභාවේ ආදායම ප්‍රධාන වශයෙන් වාර්ෂික බලපත්‍ර ගාස්තු ලෙස ලැබෙන මුදල්, අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන් වලින් ලැබෙන මුදල් සහ පරීක්ෂණවල දී වරදකරුවන් වන ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගෙන් අය කරනු ලබන පරීක්ෂණ ගාස්තු මගින් ලබයි.

2015.12.31 දිනට ලංකා බැංකුවේ පවත්වාගෙන යනු ලබන ස්ථාවර ගිණුම් කිපයක තිබූ මුදල රු.7,383,703,.47 කි.

**3. අවසාන ගිණුම් වාර්තා**

2015 ඊට අදාළ ගිණුම් වාර්තා මේ සමග අමුණා ඇත.



# 10. 2015 වර්ෂය සඳහා අවසාන ගිණුම් ප්‍රකාශනය

ඉඩම් අමාත්‍යාංශය

# ඉඩම් මැනුම් සභාව

## 2015 දෙසැම්බර් 31 වන දිනට

## මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය

| විස්තරය | සටහන් | 2015 | | 2014 | |
|---|---|---|---|---|---|
| | | රු | රු | රු | රු |
| **වත්කම්** | | | | | |
| ජංගම වත්කම් | | | | | |
| මුදල් හා මුදල් සමාන දෑ | 1 | 2,266,843.18 | | 7,461,849.03 | |
| ලැබිය යුතු දෑ | 2 | 54,207.00 | | 147,373.73 | |
| ආපදා ණය | 3 | 127,275.00 | | 222,407.00 | |
| උත්සව අත්තිකාරම් | | - | 2,448,325.18 | 3,000.00 | 7,834,629.76 |
| | | | | | |
| ජංගම නොවන වත්කම් | | | | | |
| ස්ථාවර තැන්පතු | 4 | 7,383,703.47 | | 2,951,147.39 | |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 5 | 666,487.77 | | 517,018.54 | |
| | | | 8,050,191.24 | | 3,468,165.93 |
| මුළු වත්කම් | | | 10,498,516.42 | | 11,302,795.69 |
| | | | | | |
| **වගකීම්** | | | | | |
| ජංගම වගකීම් | | | | | |
| කලින් ලැබී ඇති බලපත්‍ර ගාස්තු | | 2,382,500.00 | | 2,401,250.00 | |
| වඩමුළු ආදායම් අත්තිකාරම | | 151,900.00 | | | |
| ගෙවිය යුතු වියදම් | | 128,936.63 | | 254,723.26 | |
| උපචිත වියදම් | | 217,159.84 | | 328,133.56 | |
| අවිනිශ්චිත ගිනුම | 6 | 8,819.71 | | 8,819.17 | |
| හඳුනානොගත් කලින් ලැබීම් | | 53,650.00 | | | |
| ආපසු යැවිය යුතු ලැබීම් | | 8,350.00 | | | |
| | | | 2,951,316.18 | | 2,992,926.53 |
| ජංගම නොවන වගකීම් | | | | | - |
| මුළු වගකීම් | | | 2,951,316.18 | | 2,992,926.53 |
| | | | | | |
| ශුද්ධ වත්කම් | | | 7,547,200.24 | | 8,309,869.16 |
| **ශුද්ධ වත්කම්/හිමිකම්** | | | | | |
| ප්‍රාග්ධන සැපයුම | | | | | |
| මහා භාණ්ඩාගාරය | | 1,043,030.00 | | 1,043,030.00 | |
| සමුච්චිත අරමුදල | | 7,236,839.16 | | 6,799,331.00 | |
| අතිරික්තය/හිඟය | | (732,668.92) | | 467,508.16 | |
| | | | **7,547,200.24** | | **8,309,869.16** |

ඉඩම් මැනුම් සභාව වෙනුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා සභාවේ සාමාජිකයන් වගකියනු ලැබේ. මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් මගින් හෙළිදරවු කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත .

| | | |
|---|---|---|
| එච්.එම්.බී.පී.හේරත් | එස්.සිවානන්දරාජා | කේ.එල්.ජී.එන්.සඳමාලි |
| ලේකම් | සභාපති | ගණකාධිකාරී |
| සංවාරක හා ඉඩම් අමාත්‍යාංශය | ඉඩම් මැනුම් සභාව | ඉඩම් මැනුම් සභාව |
| ලේකම් | Chairman | Accountant |

## ඉඩම් මැනුම් සභාව

## 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## මූල්‍ය කාර්යසාධනය

| විස්තරය | සටහන | 2015 | | 2014 | |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. |
| **ආදායම්** | | | | | |
| බලපත්‍ර ගාස්තුව | | 2,618,750.00 | | 2,678,825.00 | |
| ලියාපදිංචි ගාස්තුව | | 42,000.00 | | 73,500.00 | |
| පොලී ආදායම් | 7 | 476,087.06 | | 674,372.47 | |
| වෙනත් ආදායම් | 8 | 113,377.69 | | 1,466,684.15 | |
| වඩ්මුළු ආදායම | | 1,105,500.00 | | | |
| මුළු ආදායම | | | **4,355,714.75** | | **4,893,381.62** |
| **වියදම්** | | | | | |
| **පෞද්ගලික පඩිනඩි** | | | | | |
| වැටුප් හා වේතන | 9 | 804,030.90 | | 794,375.00 | |
| අතිකාල හා නිවාඩු දින දීමනා | | 2,461.75 | | | |
| වෙනත් දීමනා | 10 | 2,327,723.97 | | 1,730,127.33 | |
| | | | (3,134,216.62) | | (2,524,502.33) |
| **ගමන් වියදම්** | | | | | |
| දේශීය | | | (10,796.00) | | (5,211.00) |
| **සැපයුම්** | | | | | |
| ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | | 136,686.86 | | 123,503.38 | |
| වෙනත් | | 113,681.00 | | 72,495.00 | |
| | | | (250,367.86) | | (195,998.38) |
| **නඩත්තු වියදම්** | | | | | |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | | | (10,640.00) | | (4,256.00) |
| **සේවා** | | | | | |
| තැපැල් හා සන්නිවේදන | | 134,646.79 | | 134,423.71 | |
| විදුලිය හා ජලය | | 78,734.40 | | 78,734.40 | |
| වඩ්මුළු වියදම් | | 952,371.68 | | | |
| වෙනත් | 11 | 371,763.05 | | 1,359,866.38 | |
| | | | (1,537,515.92) | | (1,573,024.49) |
| ක්ෂයවීම | | | (144,847.27) | | (122,881.26) |
| මුළු වියදම් | | | (5,088,383.67) | | (4,425,873.46) |
| **කාලසීමාවට අදාල අතිරික්තය/ඌනතාව** | | | **(732,668.92)** | | **467,508.16** |

**ඉඩම් අමාත්‍යාංශය**

**ඉඩම් මැනුම් සභාව**

# 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධය වෙනස් වීම පිළිබඳ ප්‍රකාශය

| විස්තරය | ප්‍රාග්ධන ප්‍රදාන | සමුච්චිත අරමුදල/ඌනතාවය | එකතුව |
|---|---|---|---|
| 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය | 1,043,030 | 7,266,841.00 | 8,309,871.00 |
| පෙර වර්ෂයේ ගළපීම් | | (30,000.00) | (30,000.00) |
| කාල පරිච්ඡේදය සඳහා අතිරික්තය/හිඟය | | (732,668.92) | (732,668.92) |
| 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය | 1,043,030 | 6,504,172.08 | 7,547,202.08 |

## ඉඩම් අමාත්‍යාංශය
## ඉඩම් මැනුම් සභාව
## 2015 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා
## මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| විස්තරය | සටහන | 2015 | | 2014 | |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. |
| <u>මෙහෙයුම් කටයුතුවලින් මුදල්ප්‍රවාහ</u> | | | | | |
| අතිරික්තය/(ඌනතාවය) | | (732,668.92) | | 467,508.16 | |
| <u>මුදල් නොවන සංචලනයන්</u> | | | | | |
| ක්ෂයවීම | | 144,847.27 | | 122,881.26 | |
| ස්ථාවර තැන්පතු පොළිය | | (476,087.06) | | (674,372.47) | |
| ආපදා ණය (වැඩිවීම)/අඩුවීම | | 95,132 | | 70,120.00 | |
| උත්සව අත්තිකාරම් (වැඩිවීම)/අඩුවීම | | 3,000.00 | | (1,000.00) | |
| ලැබිය යුතු දෑ (වැඩිවීම)/අඩුවීම | | 93,166.73 | | 42,002.27 | |
| ගෙවිය යුතු දෑ (වැඩිවීම)/අඩුවීම | | (125,786.63) | | 6,723.26 | |
| කලින් ලැබුණ බලපත්‍ර ගාස්තුව වැඩිවීම/(අඩුවීම) | | (18,750.00) | | (80,025.00) | |
| උපචිත වියදමෙහි වැඩිවීම/(අඩුවීම) | | (110,973.72) | | 48,597.56 | |
| වඩමුළු ආදායමෙහි වැඩිවීම/(අඩුවීම) | | 151,900.00 | | | |
| ආපසු ගෙවීම්හි වැඩිවීම/(අඩුවීම) | | 8,350.00 | | | |
| අවිනිශ්චිත ගිණුමේ වැඩිවීම/(අඩුවීම) | | - | | 8,819.71 | |
| හඳුනානොගත් ලැබීම් වැඩිවීම/(අඩුවීම) | | 53,650.00 | | | |
| **මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහ** | | | (914,220.33) | | 11,254.75 |
| <u>ආයෝජන කටයුතුවලින් ජනනය වූ මුදල් ප්‍රවාහ</u> | | | | | |
| ස්ථාවර තැන්පතු | | (4,432,556.08) | | (1,625,898.39) | |
| ස්ථාවර තැන්පතු පොලිය | | 476,087.06 | | 674,372.47 | |
| ස්ථාවර වත්කම් මිළදී ගැනීම | | (294,316.50) | | (116,289.80) | |
| **මෙහෙයුම් කටයුතුවලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහ** | | | (4,250,785.52) | | 1,067,815.72 |
| <u>මූල්‍ය කටයුතුවලින් මුදල් ප්‍රවාහ</u> | | | | | |
| පෙර වර්ෂයේ ගළපීම් සමුච්චිත අරමුදල සඳහා | | | (30,000.00) | | |
| මුදල් හා මුදල් සමාන දෑ වල දළ වැඩිවීම/(අඩුවීම) | | | (5,195,005.86) | | (1,056,560.97) |
| කාල සීමාව ආරම්භයේ මුදල් හා මුදල් සමාන දේ | | | 7,461,849.03 | | 8,518,410.00 |
| කාල සීමාව අවසානයේ මුදල් හා මුදල් සමාන දේ | 1 | | 2,266,843.18 | | 7,461,849.03 |

**ඉඩම් අමාත්‍යාංශය**

**ඉඩම් මැනුම් සභාව**

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගිණුම්වලට අදාල සටහන්

**1 මුදල් හා මුදල් සමාන දෑ**

| | | | | | |
|---|---|---|---|---|---|
| | බැංකුවේ ඇති මුදල | | | | 513,554.82 |
| | අතැති මුදල් | | | | 0.60 |
| | <u>ස්ථාවර තැන්පතු</u> | | | | |
| අනු අංකය | බැංකුව | කාලය | ගිණුම් අංකය | වටිනාකම | |
| 1 | ලංකා බැංකුව, නාරාහේන්පිට | මාස 3 | 78402778 | 753,287.76 | |
| 2 | ලංකා බැංකුව, නාරාහේන්පිට | මාස 1 | 77833331 | 500,000.00 | |
| 3 | ලංකා බැංකුව, නාරාහේන්පිට | මාස 3 | 77833540 | 500,000.00 | |
| | | | | | 1,753,287.76 |
| | | | | | 2,266,843.18 |

**2 ලැබිය යුතු දෑ**

ලැබිය යුතු පොලී ආදායම 54,207.00

**3 ආපදා ණය**

ටී. ජී. ප්‍රනාන්දු 127,275.00

**4 ස්ථාවර වත්කම්**

| අනු අංකය | බැංකුව | කාලය | ගිණුම් අංකය | වටිනාකම | |
|---|---|---|---|---|---|
| 1 | ලංකා බැංකුව, නාරාහේන්පිට | මාස 3 | 70070797 | 2,347,663.96 | |
| 2 | ලංකා බැංකුව, නාරාහේන්පිට | මාස 3 | 7256887 | 2,000,000.00 | |
| 3 | ලංකා බැංකුව, නාරාහේන්පිට | වසර 1 | 71352120 | 1,536,039.51 | |
| 4 | ලංකා බැංකුව, නාරාහේන්පිට | වසර 1 | 76670842 | 1,500,000.00 | |
| | | | | | 7,383,703.47 |

**5 - යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ**

| අයිතම | **2015-01-01** දිනට ශේෂය රු. | වර්ෂය තුළදී මිළදී ගැනීම රු. | එකතුව රු. | ක්ෂය වීම % | වාර්ෂික ක්ෂයවීම රු. | **2015.12.31** දිනට ශුද්ධ වටිනාකම |
|---|---|---|---|---|---|---|
| යන්ත්‍රෝපකරණ | 109,539.04 | 182,928.00 | 292,467.04 | 20 | 58,493.41 | ***233,973.63*** |
| ගෘහ භාණ්ඩ | 147,411.90 | 60,439.50 | 207,851.40 | 10 | 20,785.14 | ***187,066.26*** |
| පරිගණක | 131,673.75 | | 131,673.75 | 25 | 32,918.44 | ***98,755.31*** |
| කාර්යාලීය උපකරණ | 37,532.25 | | 37,532.25 | 25 | 9,383.06 | ***28,149.19*** |
| **ඉමදුස** නාම පුවරුව | 52,641.60 | | 52,641.60 | 20 | 10,528.32 | **42,113.28** |
| ගොඩනැගිලි හාපිරියත | 38,220.00 | | 38,220.00 | 20 | 7,644.00 | **30,576.00** |
| ගිණුම් මෘදුකාංගය | | 50,949.00 | 50,949.00 | 10 | 5,094.90 | **45,854.10** |
| **එකතුව** | 517,018.54 | **294,316.50** | **811,335.04** | | **144,847.27** | **666,487.77** |

**6** **උපචිත වියදම්**

| අනු අංකය. | වියදම් | රු. | රු. |
|---|---|---|---|
| 1 | දුරකථන ගාස්තු | 6,338.84 | |
| | පාලක කමිටු | | |
| 2 | සාමාජික වියදම් | 11,000.00 | |
| | පුහුණු සේවක | | |
| 3 | ගාස්තු | 13,500.00 | |
| 5 | විගණන ගාස්තු | 186,321.00 | |
| | | | **217,159.84** |

**7** **ස්ථාවර තැන්පතු පොලී**

| **අනු අංකය.** | **තැන්පතු අංකය** | රු. | රු. |
|---|---|---|---|
| 1 | 70070797 | 114,273.72 | |
| 2 | 7256887 | 99,371.04 | |
| 3 | 76670842 | 87,802.00 | |
| 4 | 71352120 | 84,892.12 | |
| 5 | 74176142 | 47,237.15 | |
| 6 | 75333664 | 18,779.84 | |
| 7 | 77833540 | 10,248.54 | |
| 8 | 77833331 | 6,903.77 | |
| 9 | 78402778 | 125.00 | |
| 10 | 78087838 | 3,166.12 | |
| 11 | 78202123 | 3,287.76 | |
| | | | **476,087.06** |

**8** **වෙනත් ආදායම්**

| | | |
|---|---|---|
| පඩි රහිත නිවාඩු | 4,886.13 | |
| බාහිර පාඨමාලා ආදායම් | 20,800.00 | |
| දඩ ගාස්තු | 25,000.00 | |
| තොරතුරු නිකුත් කිරීම සඳහා අයකිරීම් | 54,200.00 | |
| සේවක ණය පොළිය | 8,491.56 | |
| | | **113,377.69** |

9 **වැටුප් හා වේතන**

| | | |
|---|---|---|
| වැටුප් හා වේතන | 605,644.84 | |
| සේවක අර්ථසාධක අරමුදලේ දායකත්ව මුදල | 158,708.85 | |
| සේවක භාරකාරත්ව අරමුදලේ දායකත්ව මුදල | 39,677.21 | |
| | | **804,030.90** |

10 **වෙනත් දීමනා**

| | | |
|---|---|---|
| ජීවන වියදම් දීමනා | | 280,800.00 |
| විශේෂ දීමනා | | 118,380.97 |
| අන්තර් දීමනා | 315,000.00 | |
| පුහුණු සේවක | 140,248.00 | |

| | | | |
|---|---|---|---|
| | | දීමනා | | |
| | | සභාපතිගේ කාර්යය දීමනා | 362,500.00 | |
| | | උප සභාපතිගේ කාර්යය දීමනා | 290,000.00 | |
| | | වැඩබලන ලේකම්වරයාගේ කාර්යය දීමනා | 115,590.00 | |
| | | ගණකාධිකාරිගේ කාර්යය දීමනා | 68,805.00 | |
| | | ඉ.මැ.ස. සාමාජික දීමනා | 541,200.00 | |
| | | විගණන කමිටු සාමාජිකයන්ගේ දීමනා | 95,200.00 | |
| | | | | **2,327,723.97** |
| | **<u>සැපයුම්</u>** | | | |
| 11 | **වෙනත්** | | | |
| | | විගණන ගාස්තු | 100,000.00 | |
| | | මුද්‍රණ සහ පොත් බැඳීම් | 129,609.00 | |
| | | දැන්වීම් | 79,759.05 | |
| | | සේවක පුහුණු පාඨමාලා ගාස්තු | 49,000.00 | |
| | | ලැමිනේටින් | 13,395.00 | |
| | | | | **371,763.05** |

# ඉඩම් මැනුම් සභාව

## 2015-12-31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා

## පොදු ගිණුම් ප්‍රතිපත්ති

1. පොදු ගිණුම් ප්‍රතිපත්ති

1.1. සැකසීමේ පදනම
ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිතීන්ට සහ 1971 අංක.38 දරන මූල්‍ය පනතේ විධිවිධානවලට අනුව මූල්‍ය ප්‍රකාශන සකස්කරනු ලැබේ.

1.2. මූල්‍ය ප්‍රකාශන උපචිත පදනමින් සකස් කොට ඇත.

1.3. මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය සම්මතය යටතේ සකස් කෙරේ.

**2.** වත්කම් ඇගයීමේ පදනම

2.1. ස්ථාවර වත්කම් කපාහල අගයට දක්වා ඇත.

2.2. ක්ෂය වීම
ස්ථාවර වත්කම් ක්ෂයවීම හීනවන ශේෂ ක්‍රමය යටතේ පසුගිය වර්ෂයට අනුකූලව පහත සඳහන් අනුපාතය මත සපයා ඇත.

| වත්කම් වර්ගය | % |
|---|---|
| යන්ත්‍රෝපකරණ | 20 |
| ගෘහ භාණ්ඩ | 10 |
| පරිගණක | 25 |
| කාර්යාලීය උපකරණ | 25 |
| නාම පුවරුව | 20 |
| ගොඩනැගිලි හා පිරියත | 20 |
| ගිණුම් මෘදුකාංගය | 10 |

# ඉඩම් අමාත්‍යාංශය

# ඉඩම් මැනුම් සභාව

# 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

# පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති

## 1. <u>පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති</u>

1.1 පිළියෙල කිරීමේ පදනම

1971 අංක 38 දරණ මුදල් පනතේ ප්‍රතිපාදන සහ ශ්‍රී ලංකා රාජ්‍ය සේවා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වන සේ මෙම ගිණුම් ප්‍රකාශ සකස් කර ඇත.

1.2 මෙම ගිණුම් ප්‍රකාශයන් උපචිත පදනම මත සකස් කර ඇත.

1.3 මෙම ගිණුම් ප්‍රකාශයන් ඓතිහාසික පිරිවැය සම්මුතිය යටතේ සකස් කර ඇත.

## 2. <u>තක්සේරු කිරීමේ වත්කම් පදනම</u>

2.1 ස්ථාවර වත්කම් කපාහල අගය මත දක්වා ඇත.

2.2 ක්ෂයවීම

පෙර වර්ෂයට අනුකූලවන පරිදි පහත සඳහන් අනුපාතික අනුව හිඟපත් ශේෂ ක්‍රමය අනුගමනය කරමින් ක්ෂයවීම් ලබා ගෙන ඇත.

| වත්කම් වර්ගය | ක්ෂයවීම % |
|---|---|
| යන්ත්‍රෝපකරණ | 20 |
| ගෘහ භාණ්ඩ | 10 |
| පරිගණක | 25 |
| කාර්යාලයීය උපකරණ | 25 |
| නාම පුවරු | 20 |
| ගොඩනැගිලි හා ඉදිකිරීම් | 20 |
| ගිණුම්කරණ මෘදුකාංග | 10 |

# 11. විගණකාධිපති වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } ඒජීඑල්/බී/එල්එස්සී/01/15/03 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2016 නොවැම්බර් 16 දින

Land Survey Council
29 NOV 2016

සභාපති
ඉඩම් මැනුම් සභාව.

**ඉඩම් මැනුම් සභාවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

ඉඩම් මැනුම් සභාවේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2002 අංක 17 දරන ඉඩම් මැනුම් පනතේ 57(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ14(2)(සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් සභාවේ සභාපතිවරයා වෙත 2016 මැයි 04 දින නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2002 අංක 17 දරන ඉඩම් මැනුම් පනත | |
| (i) 12(1) වගන්තිය | ලියාපදිංචි බලපත්‍රලත් මිනින්දෝරුවරයෙකු විසින් සකස් කර සහතික කරන ලද නිශ්චිත වර්ගවල මුල් පිඹුරු හෝ සිතියම් පිටපත් දත්ත පාදකයක් පිහිටුවීම සඳහා තැන්පත් කළ යුතු වුවත් ඒ අනුව ක්‍රියා කර නොතිබුණි. |
| (ii) 43(1) හා (2) වගන්තිය | සභාව විසින් සියළුම ලියාපදිංචි බලපත්‍රලත් මිනින්දෝරුවරුන්ගේ නම් ලැයිස්තුවක් ගැසට් පත්‍රයේ පලකළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ ලියාපදිංචි බලපත්‍රලත් මිනින්දෝරුවරු 1,047ක් සිටියද, 2015 මාර්තු 27 දින අංක 1908 දරන ගැසට් පත්‍රයේ ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරු 992 කගේ නම් පමණක් පල කර තිබුණි. |
| (ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.3.2. ඡේදය | ප්‍රසම්පාදන විධිවිධානවලට පටහැනිව බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ පැවැත්වූ වැඩමුළු 02 ක් සඳහා ශාලා ගාස්තු හා දිවා ආහාරය වෙනුවෙන් පිළිවෙලින් රු. 209,540 ක් හා රු. 574,350 ක් වැයකර තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ සභාවේ මූල්‍ය ප්‍රතිඵලය රු.732,669 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.467,508 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,200,177 ක පිරිහීමක් දක්නට ලැබුණි. සමාලෝචිත වර්ෂයේ වැඩමුළු ආදායම රු.1,105,500 කින් වැඩි වුවද අනෙකුත් ආදායම් රු.1,353,306 කින් අඩුවීම හා සේවක ප්‍රතිලාභ රු.609,714 කින් වැඩිවීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහකිරීමේදී 2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා උච්චාවචනයන් සහිතව මූල්‍ය අතිරික්තයක් පෙන්නුම්කළ ද 2015 වර්ෂයේදී එය රු.732,669 ක ඌනතාවයක් බවට පත්වී තිබුණි. කෙසේ වුවද සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් සැලකිල්ලට ගැනීමේදී 2011 වර්ෂයේදී රු. 2,471,638 ක් වූ දායකත්වය උච්චාවචනයන් සහිතව 2015 වර්ෂයේදී රු. 2,546,395 ක් වී තිබුණි.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව ආයතනයේ ජංගම අනුපාතය 2015 හා 2014 වර්ෂවලදී පිළිවෙලින් 0.83 හා 2.6 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී ජංගම අනුපාතය පහළ මට්ටමක පැවතුණි. මේ සඳහා සමාලෝචිත වර්ෂයේදී මුදල් හා මුදල් සමාන දෑ වල රු. 5,195,006 කින් පහළ යාම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි. ජංගම වත්කම් තුළ 2015 වර්ෂයේදී සියයට 93 ක් හා 2014 වර්ෂයේදී සියයට 95 ක් නියෝජනය වනුයේ මුදල් හා මුදල් සමාන දෑ වන අතර ආයතනයේ විශාල වත්කම් ප්‍රමාණයක් ද්‍රවශීල වත්කම් තුළ රඳවා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

මැනුම් වෘත්තිය හා එහි ව්‍යවහාරයන් ක්‍රමවත්ව පවත්වා ගන්නා බවටත්, වෘත්තියෙන් බලාපොරොත්තු වන්නාවූ තාක්ෂණික නියමයන් සහ සදාචාරමය ප්‍රමිතීන්වලට එකඟවන ලෙස පුහුණුවක් හෝ අධ්‍යාපනයක් වෘත්තියට ප්‍රවේශවන්නන් වෙත ලැබෙන බවටත්, එම නිසා වෘත්තියේ යෙදෙන්නන් විසින් වෘත්තිය පැවැත්මේ ඉහළම ප්‍රමිතීන් පවත්වා ගනු ලබන බවටත් තහවුරු කිරීම 2002 අංක 17 දරන ඉඩම් මැනුම් පනත ප්‍රකාරව සභාවේ අරමුණු වේ.

ක්‍රියාකාරී සැලැස්ම අනුව කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රගතිය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ විසඳීමට තිබූ මුළු පැමිණිලි සංඛ්‍යාව 105 ක් වුවද වර්ෂය තුළ විසඳා තිබුණේ පැමිණිලි 64 ක් හෙවත් සියයට 61 ක ප්‍රමාණයක් පමණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව සභාව විසින් වෘත්තීය සංවර්ධන වැඩසටහන් 6 ක් පැවැත්වීමට ඉලක්ක කර තිබුණද පවත්වා තිබුණේ වැඩසටහන් 3 ක් පමණි.

(ඇ) ස්වකීය නිලධාරීන් හා සේවකයන් සඳහා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමයක් පිහිටුවීම සහ සුභසාධන හා ක්‍රීඩා පහසුකම් සැපයිය යුතු වුවත් ඒ අනුව ක්‍රියා කර නොතිබුණි.

(ඈ) සභාවේ කටයුතු පරිපාලනය සම්බන්ධයෙන් අවශ්‍ය රීති සකස් කළ යුතු වුවත් එම නියමය පරිදි ක්‍රියාකර නොතිබුණි.

(ඉ) වාර්ෂික බලපත්‍ර නිකුත් කරනු ලැබීමට හිමිකම් ඇති සෑම මිනින්දෝරුවරයෙකුම ඉඩම් මැනුම් පනත යටතේ ලියාපදිංචි වියයුතු බව දක්වා ඇතත්, වාර්ෂිකව බලපත්‍ර ලබා නොගෙන වෘත්තීය මිනින්දෝරු කටයුතුවල යෙදෙන පුද්ගලයන් හඳුනාගැනීමට හෝ එවන් කටයුතු තහනම් කිරීමට සභාව විසින් නීති රීති හඳුන්වා දී නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

-------------------------------

සභාවේ කටයුතු ආරම්භ කළ 2005 වර්ෂයෙන් පසුව මිනින්දෝරුවරයෙකු සභාවේ ලියාපදිංචි වීමේදී අයකරනු ලබන රු. 3,500 ක් වූ ලියාපදිංචි ගාස්තුව හා 2010 වර්ෂයෙන් පසුව වාර්ෂික බලපත්‍ර වෙනුවෙන් මිනින්දෝරුවරයෙකුගෙන් අයකරනු ලබන රු. 2,500 ක් වූ ගාස්තු සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා සංශෝධනය කර නොතිබුණි.

## 4.3 කාර්ය මණ්ඩල පරිපාලනය

ඉඩම් මැනුම් පනතේ 38 (ඇ) ඡේදය පරිදි සභාවේ කටයුතු කරගෙන යාම සඳහා ප්‍රමාණවත් නිලධාරීන් හා සේවකයින් පත්කළ යුතු බව සඳහන් කර තිබුණද, 2016 අප්‍රේල් 30 දින වන විටත් සභාවට බඳවා ගෙන තිබුණේ ලිපිකරුවන් දෙදෙනෙකු සහ කාර්යාල කාර්ය සහායකවරයෙකු පමණි. ඒ අනුව නිලධාරීන්ගේ හිඟය පැමිණිලි විසඳීමේ හා ලිපිගොනු යාවත්කාලීන කිරීමේ කටයුතුවලට බාධාවක් වී තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 5.1 විගණන කමිටු

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/ 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 ඡේදය ප්‍රකාරව මාස 03 කට වරක් විගණන කමිටු රැස්වීම පැවත්විය යුතු බව දක්වා තිබුණ ද සමාලෝචිත වර්ෂයේ මුල් අර්ධ වර්ෂයේ දී කිසිදු රැස්වීමක් නොපවත්වා දෙවන අර්ධ වර්ෂයේදී රැස්වීම් හතරම පවත්වා තිබුණි.

## 5.2 අයවැය ලේඛනමය පාලනය

අයවැයගත ආදායම් වියදම් තත්‍ය ආදායම් වියදම් සමඟ සැසඳීමේදී ආදායම් ශීර්ෂ 04 ක වැය විෂයයන් 06 ක සියයට 11 සිට සියයට 19 අතර විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 5.3 නොවිසඳී ඇති විගණන ඡේද

2009 වර්ෂයේ ජනවාරි මාසයේ සිට සභාවේ ලේකම් තනතුර පුරප්පාඩුව පවතින අතර එම තනතුරට නිලධාරීන් බඳවාගැනීමට කටයුතු කරන ලෙසට 2012 ජූලි 05 දිනැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් නියෝග කර තිබුණද එම තනතුර පිරවීමට විගණිත දිනය වූ 2016 මාර්තු 31 දක්වාම කටයුතු කර නොතිබුණි.

**5.4 වාර්ෂික වාර්තා සභාගත කිරීම**

2014 වර්ෂයේ සභාවේ වාර්ෂික වාර්තාව 2016 අප්‍රේල් 30 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**5.5 සමාජ වගකීම් ඉටුකිරීම**

බලයලත් මිනින්දෝරුවන් විසින් මැනුම්කර සකස් කරන පිඹුරු මහජනතාවට ලබාගැනීමට හැකිවන පරිදි ඒවායේ පිටපත් මැනුම් සභාවට එවිය යුතු වුවද, එපරිදි කටයුතු කර නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගිණුම්කරණය | නිසි පරිදි ලෙජර් ගිණුම් පවත්වාගෙන නොයෑම හේතුවෙන් ගිණුම්වල අවිනිශ්චිත ශේෂයක් පැවතීම. |
| (ආ) ආදායම් පාලනය | ගාස්තු සංශෝධනය කර නොතිබීම. |

එච්.එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති